# සංවර්ධනයෙන් අඩකගේ කතාව

**මානව සංවර්ධනයේ අඩක බර ඉසුලුවේ කාන්තාවයි. ඈත අතීතයේ සිට අද දක්වාම කන්තාව සංවර්ධනයේ හරි අඩක කොටස් කාරියක් වන්නීය. මෙම සහභාගිත්වය කෙබඳුද? එය ඔවුන් සලකන්නේ කෙසේද? ඒ ප්‍රශ්නයට පිළිතුරු මෙම ලිපියෙන් විස්තර කෙරේ.**

**කෘ**ෂිකර්මයෙහි නියැලෙන කාන්තාවන් කීප දෙනෙක් සමග ඔබ වෙනුවෙන් සාකච්ඡා කිරීමට පසුගිය සතියේදී මට හැකිවුනා.

බොහෝ දුරට යැපුම් මට්ටමේ කෘෂිකර්මයක් ඇති. ශ්‍රී ලංකාව වගේ රටක, කෘෂි නිෂ්පාදනයේ වැඩි කොටසක් නියෝජනය කරන්නේ පුරුෂ පක්ෂය බව බැලු බැල්මට පෙනේ. එහෙත් මේ දෙස විමසිල්ලෙන් යුතුව බලන විට ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදන ක්‍රියාවලියට කාන්තා පක්ෂයේ ඇති ක්‍රියාත්මක සහභාගිත්වය දැකිය හැකිය. සමහර විට, කාන්තාවන්ගේ සහයෝගය නැති නම් ගොවියාට බොහෝ ගොවිකටයුතු කර ගැනීමට අපහසු වේයයි කීවොත් එය සත්‍යයක්.

ඇස්. පී. මිසිනෝනා මහත්මිය ගම්පහ ප්‍රදේශයේ ගොවි බිරිඳක්. ඇගේ සැමියා අක්කරයක කුඹුරක් සහ අක්කර දෙකක පොල් ඉඩමක් හිමි ගොවි මහතෙක්. කෘෂිකාර්මික කටයුතු වලට ඇගේ සහභාගිවීම ගැන මම ඇගෙන් විමසුවා. යලමහ කන්න දෙකේ දීම කරන කුඹුරු ගොවිතැනට ඇය ක්‍රියාත්මකව සහභාගි වන බව පැවසුවා.

"පැල සිටුවීම, වල්නෙලීම, ගොයම් එකතු කිරීම, වී හුලං කිරීම, වේලීම වැනි කටයුතු සියල්ල වෙන්නෙ, මගෙත් තවත් හිතවත් කාන්තාවන් කීප දෙනෙකුගේත් දෑත් වලින් තමයි. ඒවා යන්ත්‍ර වලින් කරන්න අමාරුයි. අනිත් අතට ගොයම් සිටුවීම වගේ එකතැන දිග කාලයක් ඉන්න අවශ්‍යවන කටයුතු වලට පිරිමින්ට වඩා කාන්තාවන් දක්ෂයි.

"අස්වනු කපා අවසන් කළ පසුවද, ඒවා ගබඩා කිරීමේදීත්, සකසුරුවම් කමින් යුතුව පරිහරණයේදීත්, ඒවගේම වී තැම්බීම හා සහල් පිරිසුදු කිරීම වැනි සැකසීම් කටයුතු වලදීත් කාන්තා ශ්‍රමයේ අගය වැටහෙනවා."

මල්වගාවේ නිරත වන සුජාතා වීරසිංහ මිළහට තමාගේ කතා පුවත හෙළිකළා. ඇය, රැකියාවක් පතා කාලය වැය නොකර දැඩි ආත්ම විශ්වාසයකින් යුතුව තම ජීවන මාර්ගය පාදගත් තරුණියක්. අ. පො. ස. සමත්වී වර්ෂ දහයක් පමණ රැකියාවක් සොයමින් සිටි අතරතුරදී, ස්වයං රැකියාවක් ලෙස මල් වගාව ආරම්භ කළ ඇය, දැන් හොඳ ඇන්තූරියම් වත්තක හිමිකාරියක්.

ඔබ මල් වගාව ආරම්භ කළේ ඇයි? මම ප්‍රශ්න කළා. "මල් වලට සාත්තු කිරීම තුළින් විශේෂ වින්දනයක් ලබා ගන්න් පුළුවන්, අනිත් අතට, පාත්ති සකස් කර මූලික වැඩ ටික කර ගත් පසුව තියෙන්නේ, බෙහෙත්, පොහොර, සහ වතුර දැමීම වැනි කාන්තාවන්ට ලෙහෙසියෙන් කරන්න පුළුවන් වැඩ. ඒ නිසා මල් වගාව අපි වගේ අයට ඉතාම සුදුසුයි".

කෘෂිකර්මයේ නියැලෙන කාන්තාවන් අතර, වැදගත්ම ස්ථානයක් හිමි වෙනවා, කෘෂිකාර්මික කම්කරු ලඳුන්ට. දිවයිනේ නොයෙකුත් ප්‍රදේශවල තේ, පොල්, රබර් වතු හා වී වගා කරන කුඹුරු ආශ්‍රිතව ජීවනෝපාය සලසා ගන්නා දසලක්ෂ සංඛ්‍යාත කාන්තා පිරිසක් සිටින බව අපි කිසිසේත් අමතක කරන්න හොඳ නෑ.

වේයන්ගොඩ ප්‍රදේශයේ ඇම්. පී. සෝමලතා සහ ජේ. ඩී. මංගොනෝනා එවැනි කාන්තාවන් දෙදෙනෙක්. ඔවුන්ගේ ජීවන වෘත්තීන් තීරණය වන්නේ, ලැබෙන කුලීවැඩ වල තත්වය අනුවයි. පැල සිටවීම, වල් නෙලීම, ගොයම් කැපීම අස්වනු සැකසීම ආදී නොයෙ

කුත් අංශවල වැඩ කරන මොවුන් බිම් අහලකවත් අයිතියක් නොමැති අය. ඒත්, මුලු වර්ෂයේ පුරාම කුඹුරු වැඩ හෝ පොල් වතුවල වැඩ කරන, මොවුන්ගේ දවසක වැටුප රුපියල් 12/- 14/- අතර පහත් මට්ටමක පවතිනවා.

"අපේ කණ්ඩායම 20 ක් ඉන්නවා. ගොයම් පැල සිටවන කාලයට තැනින් තැන ගොස් වැඩ සොයාගෙන කරනවා. ඒත් දිගටම එකතැන වැඩ කරන්න ලැබෙන්නේ නෑ. සාමාන්‍යයෙන් අක්කර 2-3ක කුඹුරු කැබලි එකින් එකට ගොස් වැඩ කරන්න අපට සිදු වෙනවා. දිවා ආහාරය සහ පඩිය කුඹුරු අයිති කාරයින්ගේ කාරුණික භාවය මත වෙනස් වෙනවා. සාමාන්‍යයෙන් පැය 10 ක් උදේ හතේ ඉඳලා සවස 5 දක්වා වැඩ කරලත් රුපියල් පහළොවක් උපයා ගත්තොත් ඒ ඉතාම කලාතුරකින්.

සෝමාවති ජීවිතයේ කටුක දුෂ්කර පැත්ත විස්තර කළා.

---

සාකච්ඡා කළේ:

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ විමර්ශක

**ලලිත් ජයසූරිය**

---

"වර්ෂා කාලයක්" ආවොත් අපේ ජීවිතය ගෙන යන්න වැඩක් සොයා ගැනීම ඉතාම අමාරුයි. කුඹුරු වැඩ නැති කාලවලට, පොල් වතුවල හෝ රබර් වතුවල වැඩට යනවා ඒත් හැම තැනකදීම කාන්තාවන් වශයෙන් අපට ලැබෙන්නේ අඩු වැටුපක්. ඒත් පිරිමි කරන ප්‍රමාණයටම, සමහර විට ඊටත් වඩා වැඩි වැඩ ප්‍රමාණයක් අපේ දැතින් වෙනවා. ඒත් අපේ දෑතේ සවි ශක්තිය නැති වන කලට කාගේවත් පිහිටක් නෑ. අපිට කවුරුද පැන්ෂන් දෙන්නේ" මංගොනෝනා ඇසුවා.

ගැමි ජීවිතයේ සුන්දර පැත්ත ගැන සිහින දකින බොහෝ අයට ඒ තුළ ඇති දුක් වේදනා පිළිබඳවද හැඟීමක් ඇතිකර වීමට සමත්වූ ඔවුන් දෙදෙනාගෙන්, "ගොවිජනතාව" වෙනුවෙන් සමුගතිමි.